විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
வெளிநாட்டு வளங்கள் திணைக்களம்
Department of External Resources

මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය (3 වැනි මහල), තැ.පෙ. 277, කොළඹ 00100, ශ්‍රී ලංකාව

நிதி அமைச்சு
செயலகம் (3 ஆம் மாடி), த. பெ. இல. 277, கொழும்பு 00100, இலங்கை

Ministry of Finance
The Secretariat (3rd Floor), P.O. Box 277, Colombo 00100, Sri Lanka

Web Site:www.erd.gov.lk e-mail: info@erd.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | SC&PMU/Grant/20 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2020.08.14 |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියලුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්
සියලුම දිස්ත්‍රික් ලේකම්වරු

මහත්මයාණනි / මහත්මියණි

**ශ්‍රී ලංකාව වෙත වෙනත් රාජ්‍යයන් / විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් / විදේශ ආයතන විසින් ලබාදෙනු ලබන විදේශ මුදල් ප්‍රදානයන්, උපකරණ හා ද්‍රව්‍ය ත්‍යාග ලබාගැනීම හා ඒවා නිසි පරිදි ගිණුම්ගත කිරීම් / ඉන්වෙන්ට්‍රිගත කිරීම**

උක්ත කරුණට අදාළ මගේ අංක SC&PMU/Grant/19 හා 2019.07.25 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි (ලිපියෙහි පිටපත අමුණා ඇත).

02. ශ්‍රී ලංකා රජය විසින් ලබාගන්නා සියලුම විදේශාධාර සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී මුදල් රෙගුලාසි පරිච්ඡේද XI හි ඡේද අංක 610 සිට 626 දක්වා ඇති උපදෙස් සහ 1994 අප්‍රේල් මස 20 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 මගින් ලබාදී ඇති උපදෙස් පිළිපැදීම අනිවාර්ය වේ.

03. විශේෂයෙන්ම වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවේදී අපේක්ෂා නොකළ සහ ඒ වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන සලසා නොතිබූ මුදල් ප්‍රදානයන්, උපකරණ හා ද්‍රව්‍ය ත්‍යාග ලැබුණු විට අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන විසින් කටයුතු කළ යුතු ආකාරය මුදල් රෙගුලාසි පරිච්ඡේද XI හි "02 වැනි කොටස - විදේශ ආධාර උපයෝගීකරණය සඳහා මුල්‍ය ප්‍රතිපාදන" හා "03 වැනි කොටස - විදේශාධාර වියදම් ගිණුම්ගත කිරීම" යන ඡේදවල සහ 30/94 චක්‍රලේඛයේ ඡේද අංක 05 මගින් පැහැදිලිව දක්වා ඇත.

04. ගංවතුර, නියඟ සහ වසංගත රෝග පවතින අවස්ථාවලදී හෝ වෙනත් නිශ්චිත කාර්යයන් සඳහා ශ්‍රී ලංකාව වෙත විදේශ රාජ්‍යයන් / විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් / විදේශ ආයතන විසින් ලබාදෙනු ලබන විදේශාධාර ගිණුම්ගත කිරීමේදී හා ඉන්වෙන්ට්‍රිගත කිරීමේදී ඉහත උපදෙස් පිළිපදිමින් මු.රෙ. 622 මගින් දක්වා ඇති පරිදි කටයුතු කළයුතු අතර, මු.රෙ. 625 හා 30/94 චක්‍රලේඛයේ ඡේද අංක 05 මගින් දක්වා ඇති පරිදි වියදම් වාර්තා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතුය.

05. කොවිඩ් - 19 වසංගත රෝග මර්දන කටයුතු උදෙසා අප රට වෙත ලබාදෙන ලද සියලුම මුදල් ප්‍රදාන, උපකරණ සහ ද්‍රව්‍ය ත්‍යාග ගිණුම්ගත කිරීමේදී හා ඉන්වෙන්ට්‍රිගත කිරීමේදී ද ඉහත ක්‍රමවේදය අනුගමනය කරමින් අදාළ වියදම් වාර්තා ලබාදීමට කටයුතු කිරීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் நாயகம்<br>Director General | 94-11-2484693 | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 94-11-2484500<br>94-11-2484600 | ෆැක්ස් අංකය<br>தொலை நகல்<br>Fax | 94-11-2447633<br>94-11-2387153<br>94-11-2434876 |

06. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතාමත් අගය කොට සලකමි.

මෙයට විශ්වාසී

අජිත් අබේසේකර
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. සභාපති, මුදල් කොමිෂන් සභාව
6. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
8. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
9. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
10. සහකාර විගණකාධිපති, සහකාර විගණකාධිපති කාර්යාලය, මහා භාණ්ඩාගාරය